## පළමුවන දේව ප්‍රකාශනය

ද්විතීය නීති සංග්‍රහය 18:15-20

ද්විතීය නීති සංග්‍රහය නමැති පොතෙන් උපුටා ගත් කොටසකි.

**(ඔබේ සහෝදර ජනතාව අතරෙන් දිවැසිවරයෙක් පත් කොට මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි.)**

"දෙවි සමිඳාණන් වහන්සේ ඔබ අතරෙන් ද ඔබේ සහෝදර ජනතාව අතරෙන් ද මා හා සමාන දිවැසිවරයෙකු පත් කරන සේක. ඔබ ඔහුට සවන් දිය යුතු ය. හොරෙබ් කන්ද ලඟ ජනතාව රැස් වූ දින, දෙවි සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්, 'අපේ දෙවි සමිඳාණන් වහන්සේගේ කට හඬ අපට යළි ඇසෙන්නට ඉඩ නොතබනු මැනවි. අප මිය නොයන ලෙස මේ මහා ගින්න ද අපට තවත් පෙනෙන්න නොදෙනු මැනව' යි ඉල්ලුවහු ය. සමිඳාණන් වහන්සේ මට කතා කොට, "ඔවුන් කී දේ නැණවත් ය. නුඹේ සහෝදර ජනතාව අතරේ නුඹ හා සමාන දිවැසිවරයෙකු තෝරා පත් කොට, ඔහු කිව යුතු දේ සියල්ල ඔහුට කියා දෙන්නෙමි. ඔහුට මා අණ කරන සියල්ල, ඔහු ඔවුන්ට දන්වනු ඇත. යමෙක් මාගේ නාමයෙන් ඔහු කියන දේට සවන් නොදෙන්නේ නම් මම එවැන්නෙකුට දඬුවම් කරමි. එහෙත් මාගේ නාමයෙන් දිවැස් වැකි කීමට ඉදිරිපත් වන දිවැසිවරයා මා අණ නොකළ දෙයක් කීමට හිතට ගතහොත් හෝ අන් දේවතාවන්ගේ නාමයෙන් කතා කළොත් හෝ ඒ තැනත්තා මරනු ලැබේ."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 95:1,2, 6-9

ඔබගේ පිළිතුර: සමිඳාණන්ගේ හඬට සවන් දෙන්න. ඔබේ සිත් දැඩිකර නොගන්න.

ගීය: එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු. අප මිඳූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු. තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු. එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන්ට නමස්කාර කරමු. අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමාගේ සෙනග ය. එතුමාණන් පෝෂණය කරන බැටළුවෝය. එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත.

"පාළුකරයේ 'මස්සා' නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද 'මෙරීබා' නම් ස්ථානයේ දී මෙන්ද ඔබේ සිත් දැඩි කර නොගන්න. එහිදී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය. මගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ ය."

## <u>දෙවන දේව ප්‍රකාශනය</u>

1කොරින්ති 7:32-35

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**(අවිවාහක ස්ත්‍රිය ස්වාමින් වහන්සේට කැප වී උන් වහන්සේගේ කටයුතු ගැන සැළකිලිමත් වන්නී ය.)**

ඔබ සිත් තැවුලින් තොර ව සිටිනවාට මම කැමැත්තෙමි. අවිවාහක තැනැත්තේ ස්වාමින් වහන්සේ ප්‍රසන්න කරන්නේ කෙසේදැයි සිකමින් උන් වහන්සේගේ කාරණා ගැන අධික සැළකිල්ලක් දක්වන්නේය. විවාහක තැනැත්තේ තම භාර්යාව සතුටු කරන්නේ කෙසේදැයි සිකමින් ලෝකයේ කාරණා ගැන අධික සැළකිල්ලක් දක්වන්නේය. මෙලෙස ඔහුගේ සිතෙහි දෙගිඩියාවක් පවතී. අවිවාහක ස්ත්‍රිය හෝ කන්‍යාව හෝ ඇ ශරීරික ලෙස හා අධ්‍යාත්මික ලෙස ස්වාමින් වහන්සේට කැපව සිටින සේ උන් වහන්සේගේ කාරණා ගැන අධික සැළකිල්ලක් දක්වන්නීය. එහෙත් විවාහක ස්ත්‍රිය තම පුරුෂයා සතුටු කරන්නේ කෙසේදැයි සිතමින් ලෝකයේ කාරණා ගැන අධික සැළකිල්ලක් දක්වන්නීය. මා මෙය කියන්නේ ඔබගේ ම යහපත පිණිස ය. මාගේ කැමැත්ත නම් ඔබ විනීත ලෙස ඉත සිතින් ස්වාමින් වහන්සේට සේවය කිරීම ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්ත්‍රෝත්‍ර වේවා.

## <u>සුපුවත් ජය නද</u>

ජොහන් 1:14

ආලේලූයා! ආලේලූයා!
ධර්මයාණෝ මාංසගත ව අප සමග වැඩ විසූ සේක.
දේව වරප්‍රසාදයෙන් ද සත්‍යයෙන් ද පූර්ණ උන් වහන්සේගේ තේජශ්‍රීය, අපි දුටිමු.
ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

මාක් 1:21-28

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(ජේසුස් වහන්සේ බලය ඇත්තෙකු මෙන් ඉගැන්වූ සේක.)**

ඉන්පසු ඔව්හු කපර්ණවුමට පැමිණියහ. සබත් දින උන් වහන්සේ ධර්මශාලාවට ගොස් අනුශාසනා කළ සේක. උන් වහන්සේගේ අනුශාසනාව ගැන ඔව්හු විස්මිත වූ හ. මන්ද, උන් වහන්සේ විනයධරයන් මෙන් නොව බලධාරී කෙනෙකු මෙන් අනුශාසනා කළ හෙයිනි. එකල ඔවුන්ගේ ධර්මශාලාවෙහි අශුද්ධාත්මයක් ආවේශ වූවෙක් විය. ඔහු මෙසේ මොරහඬ දුනි; "නාසරෙත්හි ජේසුනී, ඔබත් අපත් අතර මොන ගනු දෙනුවක්ද? ඔබ ආවේ අප වනසන්ට ද? ඔබ කවරෙක් දැ යි දනිමි; ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණෝ ය." ජේසුස් වහන්සේ ඔහුට තරවටු කරමින්, "කට පියව; මොහුගෙන් දුරු වෙව" යි වදාළ සේක. එවිට අශුද්ධාත්මය ඔහු වේගයෙන් සලිත කොට, මහහඬින් මොරගසමින් ඔහු කෙරෙන් දුරු විය. ඒ දුටු සියල්ලෝ ම මවිත වී, "මේ කුමක් ද? අලුත් ධර්මයකි! මෙතුමාණෝ බලධාරී කෙනෙකු මෙන් උගන්වති; මොවුන් වහන්සේ අණ දෙන විට අශුද්ධාත්මයෝ වුව ද කීකරු වෙති" යි කී හ. එකෙණෙහි ම උන් වහන්සේ පිළිබඳ පුවත අවට ගලීලය පුරා දස දෙස පැතිර ගියේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.